# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | DFD/Cir/2015/2 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2015.03.10 |

සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව
සාමාන්‍යාධිකාරී, මහජන බැංකුව
සාමාන්‍යාධිකාරී, ජාතික ඉතිරිකිරීමේ බැංකුව
සාමාන්‍යාධිකාරී, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
සාමාන්‍යාධිකාරී, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව
සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව
සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

මහත්මයාණෙනි/ මහත්මියනි

**අයවැය යෝජනා 2015 - රාජ්‍ය බැංකු වල රන් භාණ්ඩ උකස් කළ ජනතාවට සහන සැලසීම**

ඔබ දන්නා පරිදි පසුගිය දශකය තුළ දී ජීවන වියදම සැළකිය යුතු ලෙස ඉහළ යාමේ ගැටළුවට මුහුණ දී සිටින ජනතාවට විශේෂ සහනයක් ලෙස ඔවුන් විසින් උකස් කළ රන් භාණ්ඩවලට අදාළව ගෙවිය යුතු පොලිය කපා හැරීමට 2015 අතුරු අයවැය මඟින් යෝජනා කරන ලදී. ඒ අනුව, පහත සඳහන් මාර්ගෝපදේශයන්ට අනුව 2015 මාර්තු මස 15 වන දින සිට බල පැවැත්වෙන පරිදි මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අදාළ බැංකු වලට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

1. රාජ්‍ය බැංකුවලින් රු. 200,000 ක උපරිමයක් දක්වා තනිපුද්ගල පදනම මත උකස් අත්තිකාරම් ලබා ගෙන එම උකස් අත්තිකාරම් 2015 ජනවාරි 31 වන දිනට හෝ ඊට පෙර අක්‍රිය ගනයට මාරු කර ඇති ගනුදෙනුකරුවන් මෙම සහන වැඩසටහන සඳහා සුදුසුකම් ලබයි.

2. ගනුදෙනුකරුවෙකුට ඔහු/ ඇය අදාළ බැංකුවට තම රන් භාණ්ඩ උකස් කර ඇති වාර ගණන පිළිබඳ සැළකීමකින් තොරව තම මුළු උකස් අත්තිකාරම් වටිනාකම රු. 200,000 ක උපරිමයක් දක්වා පමණක් මෙම ප්‍රතිලාභය ලබා ගත හැක.

3. එක් උකස් අත්තිකාරමක වටිනාකම හෝ උකස් අත්තිකාරම් කිහිපයක මුළු එකතුව රු. 200,000 ක උපරිම සීමාව ඉක්මවන අවස්ථාවන්හිදී මෙම සහන වැඩසටහන යටතේ සළකා බැලීම සඳහා සුදුසුකම් නොලබයි.

4. 2015 ජූනි මස 30 දිනට හෝ ඊට පෙර තම උකස් අත්තිකාරම් පියවන අවස්ථාවේදීම අදාළ ගනුදෙනුකරුවා වෙත මෙම සහනය ලබා දිය යුතුය.

5. ඉහත සඳහන් කාල සීමාව තුළ දී තම උකස් අත්තිකාරම් වලට අදාළ හිඟ මුදල් අදාළ ගනුදෙනුකරු විසින් එකවර හෝ වාරික වශයෙන් ගෙවීමේ දී එම උකස් අත්තිකාරම් වලට අදාළව අය කර ඇති 12% ට වඩා වැඩි පොලිය බැංකුව විසින් කපා හැරිය යුතුය. එයට අදාළ අලාභය භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත ප්‍රතිපූරණය කරනු ලැබේ.

6. ඉහත සඳහන් උකස් අත්තිකාරම් වලට අදාළව අයකර ඇති අනෙකුත් වියදම් ද බැංකුව විසින් කපා හැරිය යුතු අතරම එම කපා හැරීම් වලට අදාළ අලාභයන් බැංකුව විසින්ම දැරිය යුතුය.

7. එක් එක් මාසයේදී අදාළ බැංකුව විසින් කපා හරිනු ලබන පොලී මුදල් ප්‍රමාණය අදාළ බැංකුවේ අභ්‍යන්තර විගණකගේ තහවුරු කිරීම සහිතව මුදල් අමාත්‍යාංශයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත අදාළ බැංකු විසින් එම අදාළ මාසය අවසානයේ දී ලැබීමට සැළැස්විය යුතුය. මෙම මුදල් ඊළඟ මස පළමු සතිය තුළ දී අදාළ බැංකු වෙත මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රතිපූරණය කරනු ලැබේ.

8. බැංකුව විසින් මෙම සහන වැඩසටහන සඳහා සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන් ඒ පිළිබඳව පුද්ගලිකවම දැනුවත් කළ යුතුය.

9. මෙම යෝජනා ක්‍රමය වහාම ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත උපදෙස් මත පදනම්ව සකස්කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛය අදාළ බැංකු වල සියළුම ශාඛාවන් වෙත 2015 මාර්තු මස 10 වන දිනට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

10. මෙම යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලැබූ ගනුදෙනුකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම 2015 ජූනි මස 30 වන දින තෙක් අත් හිටවනු ලැබේ.

මේ සඳහා ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

මෙයට - විශ්වාසී

අත්. කළේ: ආචාර්ය ආර්.එච්.එස්.සමරතුංග
භාණ්ඩාගාර ලේකම් සහ
මුදල් අමාත්‍යාංශයේ ලේකම්

පිටපත්: අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
} **කා.දැ.ගැ.ස සහ අ.කා.ස.**